# තෙත් කලාපීය වර්ෂා වනාන්තර පදනම් කොටගත් සාම්ප්‍රදායික ජන ජීවිතය (රූණකන්ද සාම්ප්‍රදායික ජන කොට්ඨාසය ඇසුරින්)

චිරාත් ඉන්දුම දිගෝආරච්චි*

මධ්‍යතන ශ්‍රී ලංකාවේ භූමි බෙදීම් නිර්නායක වලට අනුව පස්යොදුන් රට විවිධ භූ විෂමතා ලක්ෂණ මගින් සීමා කරණ ලද ඓතිහාසික ප්‍රදේශයකි. මෙරට මූලික ජනාවාස ව්‍යාප්ත වීමේ අවධියේ සිට මෙසොලිතික යුගය අවසානය දක්වා කාල පරිච්ඡේදයක් තිස්සේ මෙම ප්‍රදේශය මිනිස් වාසයක් ව පැවති බවට සාධක පවතී. වර්තමාන තරඟකාරී ආර්ථික රටාව හා අනුගතවීම සමඟ සාම්ප්‍රදායිකත්වය ගිලිහී යන මොහොතක කළුතර දිස්ත්‍රික්කයේ පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි රූණකන්ද යෝජිත රක්ෂිත වනාන්තරය තුළ හුදකලාව ජීවත් වූ ජන කොට්ඨාසයක් පිළිබඳව කරන ලද අධ්‍යයනයකදී සාම්ප්‍රදායිකත්වයේ සුන්බුන් දක්නට ලැබිණි. පහතරට තෙත් කලාපීය වැසි වනාන්තරයක් වන රූණකන්ද මගුරු ගඟේ ප්‍රධාන පෝෂක ප්‍රදේශය වේ. කුඩා කඳු පංති හා නිම්න වලින් හෙබි 410- 480 මීටර ක් දක්වා උන්නතාංශක් (Altitude ) සහිත භූමියකි. ඒ අනුව ජීවත්වීමට අවශ්‍ය කරන සංජනනාත්මක සාධක කීපයක් පදනම් කොටගෙන ගොඩනැගී ඇති රූණකන්ද සාම්ප්‍රදායික නිවාස කිහිපය හා දැනට ජීවත්වන වැසියන් හා සාම්ප්‍රදායික කර්මාන්ත, වාස්තු විද්‍යා නිර්මණ කෙරෙහිත් මෙහිදී අවදානය යොමුවන අතර වැඩිදුර අධ්‍යයනය මගින් ප්‍රාග් ඉතිහාසය දක්වා දිවයන ලාංකීය ඉතිහාසය ගොඩනැගීමේදී අධ්‍යයනය කළ යුතු සමාජමය ලක්ෂණ වලින් හෙබි බවත් අධ්‍යයනය කරන ලදී. මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍රයට ගොස් සාම්ප්‍රදායික වැසියන් හා මෙන්ම එවුන් සමඟ සමීප ඇසුරක් පවත්වන හැඩිගල්ල ග්‍රාමයේ ජනතාව හා කරන ලද සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත සපයා ගැනීමට සිදු වූ අතර තවදුරටත් පුස්තකාල අධ්‍යයන මඟින් තොරතුරු සපයා ගන්නා ලදී. මූලික ගවේෂණ කටයුතු වලදී රූණකන්ද සංරක්ෂණ මධ්‍යස්ථානයේ මඟපෙන්වීම යටතේ ජල විද්‍යාත්මක ලක්ෂණ, ආවේණික සත්ව, ශාක හා මත්ස්‍ය විශේෂයන්ගෙන් පෝෂිත භූමියක් බව දක්නට ලැබිණි. ඒ අනුව කාලය අවකාශය යන සාධක මත පදනම්ව සත්ව හා ශාක ප්‍රජාවේ විහිදීම GIS තොරතුරු පද්ධතියක් ඇසුරින් නිරූපනයත්, පාරිසරික සාධක පදනම් කරගෙන හුදකලාවීම යන්න වනාන්තරයේ ප්‍රමුඛ සාධක ආරක්ෂා කිරීමත්, ජීවත්වීමේ අවම සාධක කීපයකට අනුගත වූ පිරිසක් ජීවත්වීමත් යන කරුණු කෙරෙහි අවධානය යොමු කෙරේ. මේ අනුව දැනට යෝජිත රක්ෂිත වනාන්තරයක්ව පවතින රූණකන්ද ස්වාභාවික සංචාරක වපසරිය පමණක් නොව සංස්කෘතික සංදර්භයෙන්ද යුක්ත පුළුල් සංචාරක භූමියක් ලෙස දැක්විය හැකිය.

ප්‍රමුඛ පද : හුදකලාවීම, වාස්තු විද්‍යා, සාම්ප්‍රදායිකත්වය, සංචාරක

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය chirath.digo@gmail.com